# දිවා සුරැකුම් මධ්‍යස්ථාන පාලිකා හා පෙර පාසල් ගුරු, දිවා සුරැකුම් මධ්‍යස්ථාන සහායිකා, දිවා සුරැකුම් මධ්‍යස්ථාන පවිත්‍රකරු

**අවසාන වන දිනය: 2019-07-12**

පාර්ලිමේන්තුවේ මහ ලේකම්ගේ කාර්ය මණ්ඩල සාමාජිකයන්ගේ දරුවන් සඳහා පවත්වාගෙන යාමට යෝජිත දිවා සුරැකුම් මධ්‍යස්ථානයේ දිවා සුරැකුම් මධ්‍යස්ථාන පාලිකා හා පෙර පාසැල් ගුරු , දිවා සුරැකුම් මධ්‍යස්ථාන සහායිකා හා පවිත්‍රකරු තනතුරු සඳහා කොන්ත්‍රාත් පදනම මත මනා සෞඛ්‍ය තත්ත්වයකින් හා විශිෂ්ට චරිතයකින් යුතු ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් (කාන්තාවන්ගෙන් පමණක්) අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙහි පහත දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය ප්‍රකාරව පිළියෙල කරගත් අයදුම්පත් 2019 ජුලි මස 12 වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ **"පාර්ලිමේන්තුවේ මහ ලේකම්, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටෙ"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ අදාල තනතුර සඳහන් කළ යුතුය.

| අනු අංකය | තනතුර | පුරප්පාඩු සංඛ්‍යාව | අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් / පළපුරුද්ද | මාසික වැටුප (රුපියල්) |
|---|---|---|---|---|
| **01** | **දිවා සුරැකුම් මධ්‍යස්ථාන පාලිකා හා පෙර පාසල් ගුරු (කොන්ත්‍රාත් පදනම)** | 01 | අ.පො.ස(සා.පෙළ) විභාගය දෙවරකට නොවැඩි වාර ගණනකදී සිංහල/දෙමළ භාෂාව, ගණිතය සහ ඉංග්‍රීසි භාෂාව සඳහා සාමාන්‍ය සාමාර්ථ සහිතව විෂයන් 06කින් එකවර සමත්වී තිබීම හා පූර්ව ළමාවිය පිළිබඳව පිළිගත් ආයතනයකින් ලබා ගන්නා ලද ඩිප්ලෝමා සහතිකය<br>සමඟ<br>අදාල ක්ෂේත්‍රයේ වසර දෙකක පළපුරුද්ද | 30,000.00 |
| **02** | **දිවා සුරැකුම් මධ්‍යස්ථාන සහායිකා (කොන්ත්‍රාත් පදනම)** | 01 | අ.පො.ස(සා.පෙළ) විභාගය දෙවරකට නොවැඩි වාර ගණනකදී සිංහල/දෙමළ භාෂාව, ගණිතය සහ ඉංග්‍රීසි භාෂාව සඳහා සාමාන්‍ය සාමාර්ථ සහිතව විෂයන් 06කින් එකවර සමත්වී තිබීම.<br>සමඟ<br>අදාල ක්ෂේත්‍රයේ මාස හයක(06) පළපුරුද්ද | 25,000.00 |
| **03** | **දිවා සුරැකුම් මධ්‍යස්ථාන පවිත්‍රකරු (කොන්ත්‍රාත් පදනම)** | 01 | 8 වන ශ්‍රේණිය සමත් හා අදාල ක්ෂේත්‍රයේ මාස 06 ක පළපුරුද්ද | 17,500.00 |

<u>බඳවා ගැනීම සඳහා පොදු කොන්දේසි</u>

**01.** අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස :- අවුරුදු 20ට නොඅඩු හා අවුරුදු 50 ට නොවැඩි විය යුතුය.
**02.** බඳවා ගැනීමේ ක්‍රමය :- සම්මුඛ පරීක්ෂණයක් මඟිනි.
**03.** **පාර්ලිමේන්තු සංකීර්ණයේ සිට 15km සීමාව තුළ පදිංචිකරුවන් විය යුතුය. (විශේෂයෙන් කඩුවෙල, බත්තරමුල්ල,**





**මාලබේ, මහරගම, කොලොන්නාව, දෙහිවල, ගල්කිස්ස ප්‍රදේශයන්හි පදිංචිකරුවන් කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.)**

**04.** **සේවයේ නියුක්ත කරවීමේ නියමයන් හා සේවා කොන්දේසි:-**

(i) තෝරා ගනු ලබන අයදුම්කරුවන් පාර්ලිමේන්තුවේ මහ ලේකම්ගේ කාර්ය මණ්ඩලයට අදාළ වන මූල්‍ය හා දෙපාර්තමේන්තු රෙගුලාසිවලට යටත් වනු ඇත.
(ii) කොන්ත්‍රාත් කාල සීමාව වසර දෙකක් (02) වන අතර සතුටුදායක සේවා කාලයක් තුළ අපේක්ෂිත කාර්ය සාධනය ලඟාකර ගැනීම මත කොන්ත්‍රාත් කාල සීමාව දීර්ඝ කිරීම සඳහා සලකා බලනු ලැබේ. තෝරා ගනු ලබන අයදුම්කරුවන් ගිවිසුමකට එළඹිය යුතුය.
(iii) ඉහත සියළු තනතුරු කොන්ත්‍රාත් පදනම මත කරනු ලබන පත්වීම් හෙයින් පාර්ලිමේන්තු මහ ලේකම්ගේ කාර්ය මණ්ඩලයේ ස්ථිර තනතුරක් ලබා ගැනීම සඳහා සලකා බැලීමට කිසිදු අයිතිවාසිකමක් නොමැත.
(iv) තෝරා ගනු ලබන අයදුම්කරුවන් වෛද්‍ය පරීක්ෂණයකට භාජනය විය යුතුය.
(v) තෝරා ගනු ලබන අයදුම්කරුවන් පත් කරනු ලැබීමට පෙර ඔවුන් පිළිබඳව ආරක්ෂක නිශ්කාෂණ තොරතුරු වාර්තා ලබා ගනු ඇත.

**05.** අයදුම්කරුවන් විසින් පහත සඳහන් සහතිකවල පිටපත් (මුල් පිටපත් නොවේ.) සිය අයදුම්පත්වලට ඇමිණිය යුතු අතර, ඉල්ලා සිටින විටෙක මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුය.

(අ) උප්පැන්න සහතිකය
(ආ) අධ්‍යාපන සුදුසුකම් සනාථ කෙරෙන සහතික
(ඇ) වෘත්තීයමය සුදුසුකම් සනාථ කෙරෙන සහතික
(ඈ) පළපුරුද්ද සනාථ කෙරෙන සහතික

**06.** තනතුරු ලබා ගැනීමේ අරමුණින් කවර හෝ ආකාරයකින් බලපෑම් කිරීම තනතුර සඳහා නුසුදුසුකමක් වනු ඇත.

**07.** අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පසුව එවනු ලබන හෝ ඉහත සඳහන් කළ, සහතිකවල පිටපත් රහිතව එවනු ලබන අයදුම්පත් හා ආකෘති පත්‍රය ප්‍රකාරව පිළියෙල නොකරන ලද අයදුම්පත් ද ප්‍රතික්ෂේප කරනු ලැබේ.

පාලක මණ්ඩල සභාපති
පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලීය දිවා සුරැකුම් මධ්‍යස්ථානය

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව,
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටෙ,
2019 ජුනි මස 27 වැනි දින.

Source: www.parliament.lk (2019.07.11)